## Abstract 34

# භික්ඛු වස්සාවාසය සම්බන්ධව පැන නැගී ඇති නූතන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

**ඩබ්. ආර්. විසාකා මල්කාන්ති විජේරත්න,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර-බෞද්ධ සංස්කෘතිය),
*wimansasamanalee@gmail.com*

භික්ඛු විනයට අයත් විෂය ක්ෂේත්‍රයක් වන **වස් විසීම** හෝ **වස්සාවාසය** සම්බන්ධ භික්ෂු ප්‍රතිපදාව දඹදිවට අධික වර්ෂාපතනයක් සහිත කාල වකවානුවක් පසුබිම් කොට ගෙන පණවන ලද්දකි. අන්‍යාගමික විශ්වාසයක් පදනම් කොට ගනිමින් පොදු සමාජය විසින් භික්ෂූන් වෙත කළ චෝදනාවකට පිළියම් වශයෙන් බුදුන් විසින් මෙය පණවන ලදි. විනය නීතියක් ලෙස හඳුනාගත් වස් විසීම ඒ හා ගොඩනැගුණු චාරිත්‍ර වාරිත්‍ර සමුදායයකින් සමන්විතව විකාශනය වෙමින් මේ වන විට වෙනත් රටවල ද ක්‍රියාත්මක වේ. වැසි නොමැති කාල වකවානුවක වුව ද සමාදන් වන වස්සාවාසය ආගමික හා සමාජ ප්‍රතිලාභ රාශියක් ලබාදෙන බව පෙනේ. ඇසළ පුර පසළොස්වකට පසු දින පෙර වස් විසීම හෝ නිකිණි පසළොස්වක් පොහෝ දිනට පසු දින පසු වස් එළඹීම උපසපන් භික්ෂුවක් විසින් සිදු කළ යුතු වෙයි. නමුත් එකී සෛද්ධාන්තික සාම්ප්‍රදායික පදනම අර්බුදකාරී පදනමක් මත ගොඩනැගෙමින් පවතී. මෙකල වස් සමයේ වර්ෂාවක් නො පවතින අතර වැසි සමය ආරම්භ වනුයේ වස් සමය නිමාවත් සමඟ ම ය. මෙහි ලා වස් විසීමේ මූලික අභිප්‍රායයන් නිෂ්ඵල වී යනු ඇත. වස් සමයේ සිදුවනුයේ භික්ෂුවගේ ආධ්‍යාත්මික සංවර්ධන කාර්යය මෙන් ම උපෝසථය හෙවත් පාමොක් උදෙසීමත් ගිහි පක්ෂයේ ධර්ම සාකච්ඡා ආදී කාර්යයනුත් වේ. වර්තමානයේ බොහෝ ආමිෂ පූජාවන් සිදු වන අතර ප්‍රතිපත්ති පූජාවට ලබා දී ඇති ඉඩ ප්‍රස්තාව අඩු බවත් භික්ෂුවට තමාගේ ධර්මාධ්‍යයන කටයුතු සිදු කිරීමට ඇති කාලය බොහෝ දුරට සීමා වී ඇති බවත් පෙනේ. වස් කාලය තුළ බොහෝ විහාරස්ථානවල ගිහියන් විසින් සිදු කළ යුතු චාරිත්‍ර වාරිත්‍ර සමුදායයක් ද ඇත. එසේ වූවත් වර්තමානයේ මේ සඳහා භික්ෂුව මැදිහත් වීම නිසා එම චාරිත්‍ර වාරිත්‍රවල ගුණාත්මක භාවය පිළිබඳ යම් පසුබෑමක් පවතී. මෙම ගැටලු සමථයකට පත් කර ගනු වස් කතිකාවතක අවශ්‍යතාව මතු වී ඇති බව හැඟේ.

**ප්‍රමුඛ පද :** කඨින පිංකම, පසුවස්, පෙරවස්, භික්ඛු විනය, වස්සාවාසය